# බැටළු පැටියාගේ නුවණ



ගිහන්සා රෂිනි රවිහන්සි

# බැටළු පැටියාගේ නුවණ

## ගිහන්සා රෂිනි රවිහන්සි

කතෘ

**කතෘගේ වෙනත් කෘති**

දාගකාර හා පැංචට පාඩමක්

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර
6- G ශ්‍රේණිය

ISBN 978-624-211-109- 4
10.05.2026

# පිදුම

ජීවිතයට අවබෝධයෙක් ලබා දෙමින්
දැනුමෙන් මා පෝෂණය කරන්නා වූ
මාගේ ආදරණිය ගුරු මැණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්

සෙවනැල්ලක් සේ මා පසුපස සිට
මා පෝෂණය කර ඇති දැඩි කරන
මාගේ ආදරණීය දෙමව්පියන්ටත්

මා මෙන්ම දැනුම සොයා යන
මාගේ යෙහෙලියන්ටත්
මේ පොත ආදරයෙන් මා පුද කරමි



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


එක්තරා පිටිසර ගම්මානයක
ගොවිපළක් තිබුණි. එම ගොවිපලේ බැටලු
රංචුවක් ජීවත් වුණා. ගොපලු පවුලේ අය
මේ ගොවිපලේ සතුන් ඉතා ආදරයෙන්
රැක බලා ගත්තා.




ගොපලු පවුලේ ගොපලු පුතා තමයි
බැටළුවන් බලා ගත්තේ සෑම
උදෑසනකම බැටලු රංචුව රැගෙන
ගොපලු පුතා කෑම සොයා කදුකර
ප්‍රදේශයට ගියේය.




වෙනදා මෙන්ම අදත් උදෑසනින්ම
ගොපලු පුතා බැටලු රංචුව සමඟ කෑම
සොයා කඳුකරයට ගියේය. බැටලු
රංචුව ඒ මේ අත ඇවිදිමින් ඉතා
සතුටින් හොඳින් වැඩුනු තණ කොළ
කමින් සිටියා.




මේ අතර ගොපලු පුතා ඒ අසල
විශාල ගසක් යටට වී බැටලු
රැල දෙස බලමින් ගිමන් හැරියේය.
ටික වේලාවකින් ගොපලු
පුතාට ටිකක් නින්ද ගියා.




රැලේ සිටි එක් බැටලු පැටියෙක් මිහිරි තණකොළ කමින් රැලෙන් ඈතට ගියා. බැටලු රැල දෙස පඳුරට මුවා වී බලා සිටි වෘකයෙක් මේ බැටලු පැටියව දුටු වේය.




වෘකයා සෙමින් සෙමින් බැටලු
පැටියා පිටුපසින් ගියේය. බැටලු
පැටියාට ලන්වූ වෘකයා දුටු
පැටියා බිය වී බලා සිටියේය.
අදනම්  මගෙන් ඔබට ගැලවීක් නෑ.
බැටලු පැටියෝ අද නම් මං උඹව
කාලම තමා නතර වෙන්නේ
වෘකයා කීවේය.






බොහෝ බියට පත් වූ
බැටලු පැටියා අනේ
මාව කන්න එපා
යැයි පැවසිය.



අද නම් ඔබව බේර ගන්න
කවුරුත් නැහැ.ඒ නිසා මට ඔබව
පහසුවෙන් අල්ලගන්න පුලුවන්.
මම මේ දවස එනකම් ගොඩක්
දවස් ඉදන් බලන් හිටියේ
යැයි වෘකයා කීවා.




බියෙන් වට පිට බැලූ පැටියාට
තේරුණා තමන් රැලෙන් දුරකට
ඇවිත් බව කලබල නොකර
වෘකයාගෙන් බේරීමට ඕන කියලා
බැටලු පැටියා හොද උපායක්
කල්පනා කරා. මේ අතරේ බැටලු
පැටියාට උපායක් කල්පනා වුනා.

තමන් බිය වූ වගක් වෘකයාට
නොපෙන්වා වෘකයාට මෙසේ කීවා.
වෘකයෝ මගේ බඩ තණකොළ
වලින් හොදටම පිරිලයි තියෙන්නේ
මගේ මස් වල රස වැඩි වෙන්න නම්
තණකොළ ටික දිරවන්න
ඕනි. ඒකට නම් මම ටිකක්
නටන්න වෙනවා.




හොඳයි ඔබ නටන්න මා ඔබ දෙස
බලා සිටින්නම් වෘකයා පැවසුවා.
බැටලු පැටියා නටමින් සිටියදී හොඳ
අදහසක් සිතුණි. නැටුම නතර කළ
බැටලු පැටියා වෘකයාට මෙසේ කීවා.
ඔබ මගේ කරේ තිබෙන සීනුව
රැගෙන වේගයෙන් සොලවන්න. එවිට
මට වේගයෙන් නටන්න පුලුවන් ඒ වගේම
මගේ බඩේ තිබෙන තණකොළ
ටිකන් ඉක්මනට දිරාවී.





සතුටට පත් වෘකයා බැටලු
පැටියාගේ සීනුව රැගෙන
වේගයෙන් සොලවන්න පටන්
ගත්තා. සීනුවේ හඬ ඇසුනු
ගොපලු පුතා ඉක්මනින් වට පිට
බැලුවා. එක් බැටලු පැටවකු
රංචුවේ නැති බව
දුටු ගොපලු පුතා
සීනුව හඬ ඇසෙන
දෙසට දිව
ගෙන ගියා.

දිව ආ ගොපලු පුතාට පැටවා අසල
සිටි වෘකයා දැක්කා. කෑගසා වෘකයා
එලවා දමා බැටලු පැටවා බේර ගත්තා.
බැටලු පැටියා ගොපලු පුතා සමග
සතුටින් තමන්ගේ රංචුව ලගට ආවා.
ආයේ නම් රංචුව අත හැරලා
කොහේවත් තනියමය යන්නේ නෑ කියා
බැටලු පැටියා සිතා ගත්තා.



නිමි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)